

# කුමර දිවිය



රසික සූරියආරච්චි

# ඇස්ටෝම් ගෙදර හුරුල්ලෝ

මා කුමර දිවිය ගතකළ කාලයේ ලංකාවේ ගම්බද ප්‍රදේශවල විවාහ උත්සවයක සාමාන්‍යයෙන් කොටස් හතරක් තිබුණි.

මුලින්ම පැවැත්වෙන්නේ නම් ප්‍රසිද්ධිය සහ නැකත් ගෙන ඒමයි. දෙපාර්ශවයේ පවුල්වල උදවිය ද සමහරවිට ලඟම ඥාතීන් ද සහභාගීවෙන මේ උත්සවය මනමාලිය ගේ නිවසේ පැවැත්වේ. නීතිමය වශයෙන් විවාහ වීමට අවසර ඉල්ලා මනාල යුවලගේ නම් ලියාපදිංචි කෙරෙන අතර, ඒ ප්‍රධාන මංගල උත්සවය සඳහා අවශ්‍ය නැකත් යනාදිය මනමාල පාර්ශවය වෙතින් සැපයේ. මහාප්‍රාණ සිංහලෙන් ලියවී මුද්‍රිතව මනාව රාමුකෙරුණු මේ නැකත් පත්‍ර තවමත් පැරණි නිවෙස්වල එල්ලා තිබෙනු දක්නට ඇත.

ඉන් පසුව පැවැත්වෙනුයේ ප්‍රධාන මංගල උත්සවයයි. මනාලයාගේ පැමිණීම, පිළිගැණීමේ ගීතය, දෙපා සේදීම, පෝරුවේ චාරිත්‍ර සහ නීතිමය වශයෙන් විවාහය සිදුවන්නේ මෙදිනය. මනාලිය ගේ පාර්ශවයේ සියළුම ඥාතීන් සහ හිතවතුන් මෙම උත්සවයට සහභාගී වෙතත් මනාලයා ගේ පාර්ශවයෙන් සහභාගී වෙන්නේ ළඟම ඥාතීන් සහ හොඳම හිතවතුන් පමණකි.

මංගල උත්සව මාලාවේ තුන්වැනි අංකය වන්නේ "හෝම් කමිං" ලෙස ප්‍රචලිත උත්සවයයි. මෙය පැවැත්වෙනුයේ නව යුවල සිය මධුසමය ගත කිරීමෙන් පසුව මනාලයා ගේ නිවසේ දී ය. බොහෝවිට සිදුවූයේ මනාලියගේ පාර්ශවයේ පිරිස, මධුසමය ගතකොට පැමිණෙන නව යුවල අතර මගදී හමුවී සියළු දෙනාම එකට මේ උත්සවය සඳහා මනාලයා ගේ නිවසට යෑමයි. මේ සඳහා මනාලිය ගේ පාර්ශවයේ ලඟම ඥාතීන් සහ හොඳම හිතවතුන් පමණක් සහභාගීවන අතර මනමාලයා ගේ පාර්ශවයේ සියළුම ඥාතීන් සහ මිතුරන් පාහේ සහභාගී වෙති.

එදිනම සවස් කාලයේ මනාලයා ගේ නිවසේ පැවැත්වෙන මේ මංගල උත්සව මාලාවේ අවසාන අංගය "ඇස්ටෝම් ගෙදර" නමින් හැඳින්විණ. ඉංගිරිසි ඇට්-හෝම් යන යෙදු-මෙන් බිඳී ආ මේ නමේ තේරුම නම් (නවයුවල) නිවසේ සිටිති යන්නය. සාමාන්‍යයෙන් මේ ඇස්ටෝම් උත්සවයට ආරාධනා ලබන්නෙ මනාලයා ගේ මිතුරන් සහ අසල්වැසියන් වැනි ලග ඥාතීන් නොවන පිරිස් ය.

ඒ එද ය. වත්මනෙහි නම් පෙරකී නම් ප්‍රසිද්ධිය සහ නැකත් ගෙන ඒමේ උත්සවය නොපැවැත්වේ. සෙසු උත්සව තුන ද බොහෝ විටම පැවැත්වෙන්නේ කේවල උත්සවයක් ලෙසින් දෙපාර්ශවයේ නිවෙස්වලින් පරිබාහිර උත්සව ශාලාවක් වැනි ස්ථානයකයි. මගේ කුමර දිවියේ දී මා සහභාගී වූ එක්තරා ඇස්ටෝම් උත්සයක යම් සිදුවීමක් පිළිබඳ විස්තරයක් එද මෙන් අදත් මගේ මතකයේ රැඳී පවතී.

මේ උත්සවයට සහභාගීවීමට ආරාධනාව ලැබුනේ අපේ ගමට අල්ලපු ගමේ සිටින සීයා ගේ ඥාති නිවසකිනි. අපේ සීයා මේ කාලය වන විට බණ දහම් මිසක මගුල් තුලා පිළිබඳව උනන්දුවක් නොදැක්වූ අතර තාත්තා ගේ නියෝජිතයා ලෙසින් ද ආච්චී ගේ තනි නොතනියට ද යෑමට සිදුවුණේ මටයි.

අප නිවසේ සිට ගුරුපාරේ විත් බස් පාරට පැමිණි අපි ඒ දිගේ මීටර් සීයක් ඇවිද පාරේ අනෙක් පසින් පටන් ගන්නා තවී ගුරුපාරකට වැටුනෙමු. මේ මාර්ගය අවසන්වන්නේ කුඹුරු යායකියනි. ඒ කුඹුරු යායෙන් අපේ ගමේ සීයා ගේ ඥාතීන් සිටි උතුරු ප්‍රදේශයත්, අප වාසය කළ දකුණු ප්‍රදේශයත් යා කෙරිණි.

අපට තිබුනේ වේල අයිනෙන් දිවයන මහ නියර දිගේ සැතපුම් එකහමාරක් පමණ ගමන් කිරීම පමණි.

නියර දිගේ මා ඒ ගිය ගමන ගැන ලියන විට මගේ සිහියට එන්නේ "තුම්මන් හන්දිය" චිත්‍රපටියේ එක් දර්ශනයකි. එකම වෙනස වූයේ අප මේ ගමන ගියේ ගොම්මන් කරුවලේ වීමයි.

වෙල් යායෙන් ගොඩ වී බඩවැටිය දිගේ ගිය අපට එක්වනම "ඇස්ටෝම් ගෙදර" පිළිකන්-නෙන් මතුවීමට හැකි විය. අප දුටු සීයා ගේ පාර්ශවයේ නෑයෙක් ඉදිරියට පැමිණ ආචාර සමාචාර කර අපව පිළිගත්තේය.

"වාඩිවෙන්න මහම්මේ!" යැයි කියූ ඔහු ඒ ස්වරයෙන්ම "මේ! ඔය දෙන්නෙකුට මේසයක් අරින්න" යැයි අසල සිටියෙකුට විධාන දුන්නේය. හරි හැටි වාඩිවී ඇස්ටෝම් ගෙදර සිරි නරඹන්නත් කලින් රාත්‍රී භෝජනය සඳහා ඇරයුම් කරමින් අපට වතුර පිළිගන්වන ලදී.

නිවසේ මිදුලේ එක් පසක් එලිපෙහලි කොට සාද තිබූ මගුල් මඩුව තුල ආපන ශාලාවක මෙන් කෑම මේස තබා තිබුණි. ආච්චී ට සහ මට ලැබුනේ මඩුවේ එක් කෙලවරක දෙදෙනෙකු සඳහා සකසා තිබූ කුඩා මේසයකි. මේසයේ මැද පොඩි පහේ බේසමක් පුරා බත් පුරවා තිබුණු අතර හොදි මාළුපිණි ලොකු දිසිවල පුරවා ඒ වටා තබා තිබුණි.

අපට යාබද මේසයේ සිව් දෙනෙකුගෙන් යුත් පවුලක් කෑමගත් අතර, දෙරටුව අසල තිබූ විශාල මේසයේ අට දෙනෙකුගෙන් පමණ සමන්විත කණ්ඩායමක් වාඩි වී සිටියහ.

ආහාර අනුභවකරන්නන් ට සංග්‍රහ කිරීම සඳහා මේ හැම මේසයකටම එක් අයෙක් බැගින් බෙදන්නෝ අනුයුක්ත කර සිටියහ. ඔවුන් ගේ කාර්යය වූයේ මුලින්ම අපේ පිඟන්වලට බත් බේසමේන් පීරිසියකින් බත් සහ හැඳි වලින් අනෙකුත් හොදි මාළුපිණි බෙදීමයි. ඊලඟට, අප පිඟානෙන් අඩක් කා ඉවරවෙන්නාක් සමගම පිඟාන පිරෙන්නට යලි යලි බත් සහ මාළුපිණි බෙදීම ද ඔවුන් අතින් සිදු කෙරිණි. ආහාර අනුභවකරන්නන් ට බලෙන් කැවීමක් සේ වන ඒ සංග්‍රහය එකල ගම්බද සිරිත විය.

කෙසේ හෝ වේවා, මා එදින මිරිසට පිසූ හුරුල්ලෙකු, අල බැදුම්, පරිප්පු, බෝංචි වැනි මාළුපිණි සහ පපඩම් ද සහිතව වෙනදට වඩා බත් කෑවෙමි. අතුරු පස ලෙස ආච්චී කෝලිකුට්ටු ගෙඩියක් කෑ නමුදු මගේ හිත ගියේ මී කිරි සහ පැණි වලටයි.

කා බී අවසාන වීමත් සමගම මනමාල ජෝඩුවට ආචාර කළ අපි, මුදල් දැමූ ලියුම් කවරයක් ඔවුන් අත මිට මොලවා නිවස බලා ආපසු ගමන ඇරඹුවෙමු.

"ඇස්ටෝම් ගෙදර" පිළිකන්නේ ඇරඹී, බඩ වැටිය, වෙල්යායේ මහ නියර ගුරුපාර තාරපාර හරහා අපි විනාඩි හතලිහකින් පමණ නිවසට පැමිණියෙමු. ආච්චී ගේ නිහඬතාවය බිඳුනේ අප නිවසට ගොඩවන විටම තාත්තා ඇසූ පැණයෙනි. "කොහොමද අම්මේ, ඇස්ටෝම් ගෙදර ජයට තිබුණාද?" "අපොයි ඒ වග මොකට කියනවද? ඔන්න උඹලා ගේ තාත්තලා ගේ පැත්තේ නෑයෝ. මහ කාලකණ්ණි පෙරේතයෝ වගයක්! උං මටයි කොලුවටයි දුන්නේ හුරුල්ලෝ මාළු නේ. මං දැක්කා අල්ලපු මේසේ හිටිය උන්ට නං, බල කර කර කෙලවල්ලෝ බෙදනවා. මං නං කට හරියේ තිබ්බේ නෑ ඒ හුරුල්ලෝ!"

ගමේ විවාහ මංගල්‍යයක සිව්වැනි මට්ටමේ උත්සවය වුණු "ඇස්ටෝම්" උත්සවයේ ද ඉහල සහ පහල වශයෙන් කැලෑසි දෙකක් තියෙන බව ඒ කතාවෙන් පසුව මට වැටහිණි.

ඉහල කැලෑසියට මිරිසට ඉවූ කෙලවල්ලෝ කෑලි මාළු ලැබෙන අතර පහල කැලෑසියට ලැබෙන්නේ හුරුල්ලෝ, සාලයෝවැනි කූරි මාළු ය.

අද කාලයේ ලංකාවේ පැවැත්වෙන බොහෝ විවාහ මංගල්‍යයන්හි වැඩිම වශයෙන් ඇත්තේ උත්සව දෙකක් පමණක් වන අතර ආහාර සංග්‍රයද බොහෝ දුරට බුෆේ ක්‍රමයට, එනම් කෙලවල්ලෝ ඇවැසි අයට කෙලවල්ලෝ ද, හුරුල්ලෝ ඇවැසි අයට හුරුල්ලෝ ද බෙදගත හැකිවන අයුරින් පැවැත්වෙන්නේ සමාජය එදට වඩා අද සමානාත්මක වී ඇති නිසා විය යුතුය.

## ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවල සහ පොලීසියේ සේවයේ නියුතුව සිටියවුන්ගේ සංවිධානයක් ඕස්ට්‍රේලියාවේ

පුරා වසර තිහකට වැඩි කලක් තිස්සේ අප මව්බිමේ පැතිර ගිය යුධ බිය මීට වසර දෙකකට පෙර නිමාවට පත් විය. එම දශක තුනක කාලය පුරා-වට මව් බිමේ ඒකීය බව වෙනුවෙන් ත්‍රස්තයන් අබිමුව දිවි පරදුවට තබමින් සටන් වැදුණු අපගේ ත්‍රිවිධ හමුදා විරුවෝ එම ප්‍රදේශ යථා තත්වයට පත් කිරීමේ සටනක අදට ද නියැලෙමින් සිටිති.

අතීතයට එක් වුණු යුද බිය මුහුවුණ මතකය සමඟින් මතකයෙන් ඈත් වන තවත් පිරිසක් ද වෙති. ඔවුන් නම් ඒ බියකරු යුද්ධයේ ශාපයෙන් වියෝ වූ ත්‍රිවිධ හමුදා විරුවන්ගේ පවුල් හා ආබාධිත වූ විරුවන් වේ. මේ ලැබූ මිනිස් භවය හෝ අඟ පසඟ නැවත ලබාගත හැකි නොවේ. මව් බිමේ සාමය හා ඒකීය බව වෙනුවෙන් දිවි පිදූවන්ගේ ආත්මය අපහට මේ බවයේදී ලබා දිය නොහේ. අබාධිත වූවන්ගේ අඟ පසඟ වුව යථා තත්වයට පත් කළ නොයේ. එයින් වඩාත් පීඩාවට පත් වූවෝ කවර හු ද ? ඔවුන්ගෙන් යැපුණා වූත්, ඔවුන්ගේ නාමයෙන් අදටත් යැපෙන්නාවූත් ඒ පවුල් වල සාමාජිකයින් නො වේ ද ? අප වෙනුවෙන්, අපගේ රට වෙනුවෙන්, අපගේ ආරක්ෂාව වෙනුවෙන් දිවි හිමියෙන් කැපවූවන්ගේ හිදැස පිරවිය හැකි නොවේ. එසේ වුවද ඔවුන් වෙනුවෙන් සදා කාලිකව ඉටුවිය යුතු යුතුකමක් නම් වෙයි. ඒ ඔවුන් නිසාවෙන් අසරණ වූවන් පිළිබඳව සොයා බලා අවශ්‍යනම් ඔවුනට අත හිත දීමයි. යුද්ධත්, යුද්දෙන් වියෝ වූවන්වත්, යුදයෙන් අසරණ වූවන්වත් කෙමෙන් මතකයෙන් බැහැර වන වකවානුක ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වී සිටින පිරිසක් විසින් මේ පිළිබඳව කටයුතු කිරීමට සැදී පැහැදී සිටිති.

ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාවල සහ පොලිසියේ සේවය කළ වුනගේ සංවිධානයත් ඕස්ට්‍රේලියාවේ පිහිටුවාගන්නා ලදී. එම සේවාවන්හි නියුතුව සිට මෙරටට සංක්‍රමණය වූ සියළු සාමාජිකයින්ගේ ජීවන රටාව උසස් තත්ත්වයෙන් පවත්වාගෙන යාමටත් ඔවුන් සහ ඕස්ට්‍රේලියාවේ ත්‍රිවිධ හමුදාවලත්, පොලිසියේත් සේවය කළ අය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමත් මෙම සංවිධානයේ මූලික පරමාර්ථයයි.

මෙම සංවිධානය තුළින් ත්‍රිවිධ හමුදා හා පොලීසියේ සේවයෙන් විශ්‍රාම ගත් පිරිසගේ එදිනෙදා ජීවන රටාව සහ සෞඛ්‍ය තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යාමට සහයෝගය ලබාදීමටද මේ මගින් උත්සහ කරනු ඇත. යුද්ධයේදී ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලංකාවේ වෙසෙන හමුදා සහ පොලීසිවල සාමාජිකයිනට මූල්‍ය සත්කාර කිරීමටද මෙම සංවිධානයේ අරමුණකි. මූල්‍යමය සම්පත් හිඟාකමින් සිය අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කරගැනීමට නොහැකි තත්ත්වයේ සිටිනා ත්‍රිවිධ හමුදා පොලිස් සාමාජිකයින්ගේ දරුවන් වෙත උපකාර කිරීමට ද ශිෂ්‍යත්ව පිරිනැමීම ද ස්විධානයේ අරමුණු අතර වේ.

ඕස්ට්‍රේලියාවේ සිටින සියළුම ජාතීන් හට උපකාර වන නොයෙකුත් සාමාජික සටහන් සංවිධානය කිරීම සහ ........... වෙනත් සංවිධාන දියත් කරන ........ වැඩසටහන්වලට දායක වීමක් සංවිධානයේ අනිකුත් අරමුණු වේ. සාමාජිකයන්ගේ මෙන්ම සාමාජිකයින් නොවන ත්‍රිවිධ හමුදා සහ පොලීසියේ සේවයේ නියුතුව සිටි අයගේ අවමංගල්‍ය කටයුතු සංවිධානය කිරීම සහ පවුලේ උදවිය හ මූල්‍යමය උපකාර කිරීමද තවත් අරමුණකි.

2012 අගෝස්තු 4 දා නිල වශයෙන් උත්සවාකාරයෙන් දියත් කිරීම සඳහා උත්සවයෙත් සංවිධානය කෙරෙන අතර එය මල්ග්‍රේව්හි අංක 2249 දරණ ස්ථානයේ ප්‍රින්සස් රිෂෙප්ෂන් ශාලාවේදී පැවැත්වෙනු ඇත. එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් ශ්‍රී ලංකා මහකොමසාරිස් වන හිටපු නාවුක හමුදාපති අද්මිරාල් තිසර සමරසිංහ මහතාද සහභාගී වෙන අතර ආර්.එස්.එල් සභාපති මේජර් ජනරාල් ඩේවිඩ් මැක් ලෝ හාන් මහතාද සහභාගී වෙයි. අවසානයේ ආලිංගන නැටුම් සහිත රාත්‍රී භෝජන සංග්‍රහයක් ද පැවැත්වෙයි. මේ සඳහා ප්‍රවේශ පත්‍ර රුවන් පෝල් මහතාට 0405439278 කතා කිරීමෙන් ලබා ගත හැක.

කර්නල් කාලිංග ගුණරත්න